

චිත්‍ර කලාව 6 ශ්‍රේණිය

# සිත්තමට සවියක්

චිත්‍ර කලාව කෙටි සටහන්
සහ
ප්‍රායෝගික ක්‍රියාකාරකම්

සෞන්දර්ය අංශය,
කොළඹ අධ්‍යාපන කලාපය.

# වෙසක් උත්සවය

- ලෝකවාසී බෞද්ධ ජනතාවගේ පූජනීය වූ උතුම් දිනයයි.
- වෙසක් උත්සවය අරභයා සිදුකරන ලබන පින්කම් මගින් මානව සහයෝගීතාවය හා එක්සත්කම වැනි ආකල්ප වර්ධනය වේ.
- වෙසක් උත්සවයේ දී ආමිස මෙන්ම ප්‍රතිපත්ති පූජාවට ද ප්‍රමුඛතාවයක් ලැබේ.
- බෞද්ධ බැතිමතුන් විසින් සිල් සමාදන්වීම, බෝධි පූජා පැවැත්වීම, දන්සල් හා ශබ්ද පූජා පැවැත්වීම මෙම උත්සවයේ පවත්නා සුවිශේෂී අංග වේ.
- වෙසක් උත්සවය විවිධ නිර්මාණ කිරීම සඳහා ටිෂූ කඩදාසි, ගොප්කොල, වර්ණ කඩදාසි,ඉරටු,පොල්කටු ආදි විවිධ ද්‍රව්‍ය භාවිතා කරයි.
- වෙසක් උත්සවයේ අසිරිමත් බව වැඩි කිරීම සඳහා තොරණ්, පහන් කූඩු, සුභ පැතුම්පත්, පහන් වැටි, බල්බ් වැල්, කොඩිවැල්, ආදිය යොදාගනු ලබයි.
- මැටි පහන් වෙනුවට විකල්ප ක්‍රම වසයෙන් කදුරු ගෙඩි සහ නාවා ගස් වල ගෙඩි ආදිය භාවිතා කරයි.

# තෛපොංගල් උත්සවය

- තෛපොංගල් උත්සවය හින්දු භක්තිකයන්ගේ ප්‍රධාන ආගමික උත්සවයකි.
- තෛ යනුවෙන් හඳුන්වන්නේ දමිළ අවුරුදු ක්‍රමය අනුව වසරේ පළමු වන මාසයයි.
- අලුත් සහල් දමා අලුත් මැටි මුට්ටියක කිරි ඉතිරවීම පොංගල් යනුවෙන් හඳුන්වයි.
- පොංගල් උත්සවයේදී ප්‍රධාන දොරටුව ඉදිරිපස කෙසෙල් ගස් දෙකකින් තොරණක් සාදයි.
- පිරිසිදු කරගත් ගෙබිම මැද කහ කුඩු සහ සහල් පිටි වලින් කෝලම් රටා නිර්මාණය කරයි.
- කෝලම් රටා මැද පූර්ණ කුම්භම් සාදා පහනක් තබා කිරිබත් පිළියෙල කොට හිරු නැග එත්ම, කිරි, උක්, හකුරු, පලතුරු සහ වී තබා හිරු දෙවියන්ට පූජා කරයි.



සෞන්දර්ය අංශය, කොළඹ අධ්‍යාපන කලාපය.

# රාමසාන් උත්සවය

- ඊදුල් පිත්ර් නමින් හඳුන්වන රාමසාන් උත්සවය ඉස්ලාම් ප්‍රජාවට සුවිශේෂ වූ උත්සවයකි.
- ඉස්ලාම් දින දර්ශනයට අනුව නව වන මාසය වන රමලාන් මාසයේ සඳ දුටු දින සිට දසවන මාසය වන ෂව්වාල් මාසයේ මුල් සඳ දැකීම දක්වා දින විසි නවයක් හෝ තිහක් උපවාස කාලය අවසානයේ රාමසාන් උත්සවය එළැඹේ.
- රාමසාන් උපවාසය අරාබි වහරෙන් හඳුන්වන්නේ සව්ම් යනුවෙනි
- උපවාසය ආරම්භ කරනුයේ අළුයම් නැමදුම් (සලාත්) වෙලාව ආරම්භයත් සමඟ වන අතර උපවාසය අවසන් වන්නේ හිරු බැස යන කාලය සමගය.
- උපවාසය ආරම්භයේ සිට අවසානය දක්වාම කිසිදු ආහාරපාන ගැනීමකින් තොරව ආගමික කටයුතු වල යෙදීම සිදු වේ.
- සව්ම් උපවාසයේ යෙදීම මගින් කුසගින්නේ ඇති කුරිරු බව අවබෝධ කරවීමත්, දිළින්දන්ට පිහිටවීමේ ආකල්පත් ඇති කරයි.
- උපවාස කාලය තුළ බහුල වශයෙන් අනිවාර්යෙන් දෙන දානය (Z) සකාත් යනුවෙන් හඳුන්වයි.
- උපවාස කාලය තුළ දෙනු ලබන අනිවාර්ය නොවන දානය සදකා යනුවෙන් හඳුන්වයි.
- සව්ම් උපවාසය තුලින් සිත දමනය කර ජීවත්වීමට පුහුණු වීමක් ද, ඉවසීමෙන් ජීවත්වීමේ හැකියාව ද, මනුෂ්‍යයා තුළ යහපත් ගුණදහම් වර්ධනය සහ යහපත් විනයක් පවත්වා ගැනීමට පුහුණුවක් ද ලැබේ.
- උපවාසයේ යෙදෙන කාලයේ යාඥා කරමින්, ශුද්ධ වූ කුරානය පාරායනය යෙදෙමින් (කියවමින් ) ගත කිරීම තුළින් අල්ලාහ් දෙවියන්ගෙන් අධික ආනිසංස ලැබෙන බව ඔවුන්ගේ විශ්වාසයයි.
- ෂව්වාල් මාසයේ නව සඳ දැකීමත් සමග උපවාස කාලය අවසන් කර මස්ජිදයට ගොස් යාඥා කර රාමසාන් උත්සවය පැවැත්වීම මුස්ලිම් ජනතාවගේ ප්‍රධාන කාර්යයකි.
- රාමසාන් උත්සව දිනයේ දී සිදුකෙරෙන මහත් සත් ක්‍රියාවක් ලෙස සලකන්නේ සකාතුල් ෆිත්රා නම් දානය දීමයි.

# නත්තල් උත්සවය


- නතාලා නැමැති පෘතුගීසි වචනයෙන් බිඳී ආ නත්තල යන වචනයෙන් උපත යන අර්ථය ලබාදෙයි.
- ලතින් භාෂාවෙන් නතාලිස් යන්නෙහි අර්ථය ද උපත වේ.
- ක්‍රිස්තියානි බැතිමතුන් ජේසු බිළින්දාගේ උපන්දිනය නත්තල ලෙසින් සමරයි.
- ජේසුස් වහන්සේ යනු මනුෂ්‍යත්වය ලබා ගත් දේව පුත්‍රයා වේ.
- ජේසුස් වහන්සේ සාමය කුමාරයාණන් ලෙසද සලකනු ලබයි.
- ජේසු තුමාගේ මව වන්නේ මරිය මව්තුමිය වන අතර උන්වහන්සේ සුරැකි පියා ජුසේතුමාණන් වේ.
- ජන සංගණනයක් සඳහා බෙත්ලෙහෙමට පැමිණි අවස්ථාවේ ගවලෙනක් තුළ ජේසු බිලින්දාගේ උත්පත්තිය සිදු විය.
- ජේසුස් වහන්සේගේ දේශනා හා උන්වහන්සේගේ ප්‍රාතිහාර්යයන් ද, සබත් දිනය නීති රීති කැඩීම ද හේතු කරගෙන ජුදා නායකයෝ උන්වහන්සේ කුරුසියෙ එල්ලා මරා දැමූහ.
- නත්තල් දිනයේදී දුගී ජනතාවට ආහාර පාන ඇඳුම් පැළඳුම් දීම මෙන්ම තෑගිබෝග බෙදාදීම සිදුකරයි.
- නත්තල සැමරීම සඳහා දේවස්ථාන හා නිවෙස් සැරසීම,ගවලෙන් සෑදීම හා නත්තල් ගස් අලංකරණය කිරීම ආදී සැරසිලි කරනු ලබයි.
- නත්තල් සුභ පැතුම් පත් හුවමාරු කර ගැනීම විශේෂ සිද්ධියක් වන අතර නත්තල් සීයාගේ පැමිණීම කුඩා දරුවන්ගේ ප්‍රියජනක බලාපොරොත්තුවකි.
- නත්තල් කැරොල් ගී, නත්තල් නාට්‍ය හා නත්තල ආශ්‍රිත චිත්‍රපටි දර්ශන මෙම උත්සව කාලයේ දක්නට ලැබෙන විශේෂාංග වේ.




සෞන්දර්ය අංශය,
කොළඹ අධ්‍යාපන කලාපය.


# බෞද්ධ ස්තූපය


- බෞද්ධ ස්තූපය අංග 07කින් සමන්විත ය.





- සිළුමිණ, කොත, කොත් කැරැල්ල, දේවතා කොටුව, සතරැස් කොටුව, ධාතු ගර්භය, පේසා වළලු, පාදම එම අංග 8 වේ.
- ශ්‍රී ලංකාවේ චෛත්‍යවල සතරැස් කොටුව ඉන්දියාවේ සාංචි ස්තූපයේ හඳුන්වා ඇත්තේ 'හර්මිකාව' යනුවෙනි.
- ගර්භයේ හැඩය අනුව චෛත්‍ය වර්ග කර ඇත. ඒ අනුව ප්‍රධාන චෛත්‍ය වර්ග 06කි.


බුබ්බුලාකාර


ධාන්‍යාකාර


ඝඨාකාර


ආමලාකාර



ඝණ්ඨාකාර


පද්මාකාර



සෞන්දර්ය අංශය,
කොළඹ අධ්‍යාපන කලාපය.

# හින්දු කෝවිල


- හින්දු භක්තිකයන්ගේ පූජනීය ස්ථානය වන හින්දු කෝවිලෙහි බිම් සැලැස්ම ප්‍රධාන කොටස් 04කින් සමන්විත ය.




- ගෝපුරම් හෙවත් ගෝපුර යනුවෙන් හඳුන්වා ඇත්තේ හින්දු කෝවිලෙහි ප්‍රධාන ම ගෘහ නිර්මාණ අංගය වන පිවිසුම් දොරටුව යි.




- හින්දු දේවාලයේ ඇතුළත 'ගර්භ ගෘහය' නමින් හඳුන්වන කොටසේ කුඩා හින්දු දේවාලයක හැඩය ගත් කලා අංගයක් වේ. එය කොටස් 07කින් සමන්විත ය.





- ශ්‍රී ලංකාවේ හින්දු ගෘහ නිර්මාණ කලාව කෙරෙහි දකුණු ඉන්දීය ගෘහ නිර්මාණ කලාව බලපා ඇත.
- බොහෝ ශිව දේවාල තුළ කළු ගලින් නිමවන ලද ශිව දෙවියන්ගේ වාහනය වන 'නන්දි' ගවයාගේ රුව දැක ගත හැකි ය.



සෞන්දර්ය අංශය,
කොළඹ අධ්‍යාපන කලාපය.


# ඉස්ලාම් පල්ලිය

- ඉස්ලාම් පල්ලිය 'ඉස්ලාම් මස්ජිදය' යනුවෙන් ද හඳුන්වයි.
- 'කුඟා' යනුවෙන් හැඳින්වෙන උල් වූ තුඩක් සහිත ගෝලාකාර විශාල ශිඛරය එහි විශේෂ ගෘහ නිර්මාණ අංගය යි.
- මිනාර් හෙවත් මිනරෙට් යනුවෙන් හඳුන්වන ඉස්ලාම් පල්ලියේ දෙපස ඉදිකර ඇති ගෝලාකාර ශිඛර සහිත කුලුනු විශේෂ ගෘහ නිර්මාණ අංගයකි.
- සෑම කුලුනක් මුදුනේ ම ඇති ශිඛර මත අඩ සඳ සහ තරුව ඇතුළත් සංකේතය මූර්තිමත් කර ඇත.




- ඉස්ලාම් පල්ලිවල චිත්‍ර සහ ප්‍රතිමා නිර්මාණ දක්නට නොලැබෙන අතර ඉස්ලාම් ආගමික ග්‍රන්ථය වන 'කුරානයේ' ඇති පාඨ අරාබි බසින් පල්ලියේ බිත්ති මත සටහන් කර ඇත.
- මෙම විචිත්‍ර අකුරු ලිවීමේ කලාව 'කැලිග්‍රැෆි' (Calligraphy) නමින් හඳුන්වයි.













සෞන්දර්ය අංශය,
කොළඹ අධ්‍යාපන කලාපය.

# ක්‍රිස්තියානි දේවස්ථානය


- 16 සියවසේ දී පෘතුගීසීන්ගේ පැමිණීමත් සමඟ ශ්‍රී ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශවල ක්‍රිස්තු දහම ව්‍යාප්ත වීම හේතුවෙන් ක්‍රිස්තියානි දේවස්ථාන ඉදි විය.
- රෝමානු සහ ගොතික් නිර්මාණ ශෛලීන් දෙක අනුව ශ්‍රී ලංකාවේ ක්‍රිස්තියානි දේවස්ථාන නිර්මාණය වී ඇත.
- රෝමානු ක්‍රමයේ දේවස්ථාන බොකු වහල හා රවුම් ආරුක්කුවලින් සමන්විත ය. ප්‍රධාන දොරටුවට ඉහළින් රෝස් වින්ඩෝස් යනුවෙන් හඳුන්වන අලංකාර වීදුරුවලින් නිමවා ඇති කවුළුවක් වේ.




- ගොතික් ක්‍රමයේ දේවස්ථාන තුඩු සහිත ආරුක්කුවලින් හා දෙපසට දළ බෑවුම් ඇති වහල සහිත ව නිර්මාණය කර ඇත.
- මෙම දේවස්ථානවල තුඩු සහිත කවුළුවල ක්‍රිස්තියානි ආගමට අයත් විවිධ අවස්ථා හා චරිත නිර්මාණය කර ඇත්තේ වර්ණවත් වීදුරුවලිනි. මෙම නිර්මාණ රංජිත වීදුරු නමින් හඳුන්වයි.




- ක්‍රිස්තියානි දේවස්ථානයේ බිම් සැලැස්ම කුරුසයක හැඩය ගනී. අල්තාරය, කාමර. දිග්ශාලාව, කුලුනු, බයිබලය කියවන ස්ථානය හා පිවිසුම් දොරටුව යන අංගවලින් සමන්විත වේ.





- දිග් ශාලාවේ කොණක අල්තාරය හෙවත් පූජාසනය අලංකාර වැටක් සහිත ව නිර්මාණය කර ඇත.එයට පිටු පස බිත්තිය චිත්‍ර, කැටයම් හෝ රංජිත වීදුරුවලින් ක්‍රිස්තු චරිතයේ අවස්ථා හා සිද්ධි නිරූපණය කර ඇත.





සෞන්දර්ය අංශය,
කොළඹ අධ්‍යාපන කලාපය.

# සිංහල සැරසිලි මෝස්තර

- පැරණි චිත්‍ර ගුරුවරයා සිය ගෝලයාට අභ්‍යාස කරවීම සඳහා 'යටිපෝරුව' නම් උපකරණය භාවිත කර ඇත.
- මුලින් ම උගන්වන ලද අභ්‍යාසය 'වක දෙක' නම් සැරසිලි ඒකකය වන අතර එය ක්‍රමයෙන් 'ලියපත' හා 'තිරිඟිතලය' දක්වා ව්‍යාප්ත කර ඇඳීමට පුහුණු කර ඇත.


වකදෙක


ලියපත



තිරිඟි තලය


- සිංහල සැරසිලි මෝස්තර දිව්‍ය, සත්ත්ව, උද්භිද සහ නිර්ජීවි යනුවෙන් වර්ගීකරණයක් වේ.


| | | |
|---|---|---|
| දිව්‍ය | - | ඉර සහ සඳ |
| සත්ත්ව | - | සිංහයා, හංසයා, මකරා, ගජසිංහ, හේරුණ්ඩ පක්ෂියා |
| උද්භිද | - | මල් මෝස්තර හා ලියවැල් මෝස්තර |
| නිර්ජීවි | - | අරිම්බුව, ගල්බිංදුව, කුන්දිරක්කන්, පනාව, තනිපටලණුව, දෙපටලණුව |

## දිව්‍ය

## සත්ත්ව



ඉර


සිංහයා


ගජ සිංහ


හංසයා


සඳ


මකරා



හේරුණ්ඩ පක්ෂියා

සෞන්දර්ය අංශය, කොළඹ අධ්‍යාපන කලාපය.



සෞන්දර්ය අංශය,
කොළඹ අධ්‍යාපන කලාපය.


# උද්භිද




නෙළුම් මල



කතිර මල



සපු මල




සින මල





ලියවැල් මෝස්තර


# නිර්ජීවී




අරිම්බුව




ගල් බිංදුව




කුන්දිරක්කම්



පනාව



දෙපට ලණුව



තනිපට ලණුව



සෞන්දර්ය අංශය,
කොළඹ අධ්‍යාපන කලාපය.

# වර්ණ

## මූලික වර්ණ

- නිල්, කහ, රතු වර්ණ මූලික වර්ණ යනුවෙන් හඳුන්වයි.
  (වෙන කිසිම වර්ණ දෙකක් එකතු කිරීමෙන් මෙම වර්ණ සාදාගත නොහැකිය.)

**වර්ණය** (colour)

ආලෝකය මූලික කොටගෙන ගොඩනැගෙන දෘශ්‍ය කලා මූලිකාංගයකි.

චිත්‍රණය කරන ලද කලා කෘතියේ පෘෂ්ඨයෙන් සිදු වන ආලෝක පරාවර්තනයට අනුරූප ව වර්ණ ඇසට දෘශ්‍ය වේ.

නිල්, කහ, රතු යන වර්ණ චිත්‍ර කලාවේ මූලික වර්ණ ලෙස සැලකෙන අතර ඒවා මිශ්‍රවීමෙන් පැනෙන කොළ, රඹ, දම් ද්විතීය වර්ණ වේ.

**මූලික වර්ණ (ප්‍රාථමික වර්ණ)** (Primary colour)




| නිල් | කහ | රතු |
|---|---|---|
| BLUE | YELLOW | RED |


ප්‍රාථමික වර්ණ, මූලික වර්ණ, ප්‍රධාන වර්ණ යන නම් වලින් ද හඳුන්වනු ලබන අතර වර්ණ දෙකක් හෝ කිහිපයක් හෝ මිශ්‍ර කිරීම මගින් මෙම වර්ණ නිර්මාණය කර ගත නොහැකිය. මෙම වර්ණ මිශ්‍ර කිරීමෙන් වර්ණ සැකසීම කළ හැකිය

සෞන්දර්ය අංශය, කොළඹ අධ්‍යාපන කලාපය.

## ද්විතියික වර්ණ

- කොළ, තැඹිලි (රඹ), දම්
  (මූලික වර්ණ දෙකක් එකතු වීමෙන් සෑදෙන වර්ණ ද්විතීයික  වර්ණ යනුවෙන් හඳුන්වයි.)



| නිල් + කහ = කොළ | කහ + රතු = තැඹිලි | රතු + නිල් = දම් |
|---|---|---|
| Bllue + Yellow = Green | Yellow + Red = Orange | Red + Blue = Violet |



සෞන්දර්ය අංශය,
කොළඹ අධ්‍යාපන කලාපය.

## වර්ණය (colour)

ශීත වර්ණ සහ උණුසුම් වර්ණ යනුවෙන් ප්‍රභේද දෙකකි.

### ශීත වර්ණ

වර්ණයක් දෙස බලා සිටින විට මනසට සිතලක් දැනෙන වර්ණ ශීත වර්ණ නම් වේ.

නිල්, කොළ වර්ණහා එම වර්ණයන්ගේ ප්‍රබේදයන්


මෙම වර්ණවලින් ශාන්ත බව, කරුණාව, සෙනෙහස, සිල්වත් බව වැනි භාවයන් ප්‍රකාශ වේ.

### උෂ්ණ වර්ණ

වර්ණයක් දෙස බලා සිටින විට මනසට රශ්මියක් දැනෙන වර්ණ ශීත වර්ණ නම් වේ.

රතු, කහ, තැඹිලි වර්ණහා එම වර්ණයන්ගේ ප්‍රබේදයන්

මෙම වර්ණවලින් විරෝදය, ප්‍රීතිය, තරහව, කොපය, ප්‍රචණ්ඩත්වය භය, ත්‍රාසය, රෞද්‍ර, ජයග්‍රහණය වැනි භාවයන් ප්‍රකාශ වේ.





සෞන්දර්ය අංශය, කොළඹ අධ්‍යාපන කලාපය.


## වර්ණය (colour)

### වර්ණ ශක්තිය (Tint)

වර්ණයක මිශ්‍රවී ඇති වර්ණ ප්‍රමාණය. මෙය වර්ණ තීව්‍රතාව ලෙස ද හැඳින්වේ.

### වර්ණ ප්‍රබේද ( colour Tone)

වර්ණයකට කළු හෝ සුදු වර්ණය මිශ්‍ර කිරීමෙන් වර්ණයක ප්‍රබේද නිර්මාණය කළ හැකිය.




### අපක්ෂපාති වර්ණ

කළු, සුදු, අළු වර්ණ අපක්ෂපාති වර්ණ වේ. වර්ණ දෙකක් අතරට යෙදීමෙන් විසංගත භාවය හෝ සංගත භාවය අඩු හෝ වැඩි කළ හැකිය

වර්ණ ප්‍රබේද භාවිතය



විසංගතභාවය අඩු කිරීම



සංගතභාවය අඩු කිරීම



සෞන්දර්ය අංශය, කොළඹ අධ්‍යාපන කලාපය.

## වර්ණය (colour)

සංගත වර්ණ හා විසංගත වර්ණ යනුවෙන් ප්‍රභේද දෙකකි.

### සංගත වර්ණ
ADJACENT COLOUR

කිසියම් වර්ණ දෙකක් අතර සමාන ලක්ෂණ පෙන්නුම් කරන්නේ නම් එම වර්ණ සංගත වර්ණ වේ. මෙම වර්ණ වර්ණ චක්‍රය ආසන්නයේ පිහිටන වර්ණයන්ය.



සංගත වර්ණ භාවිත නිර්මාණ
ADJACENT HARMONY



සෞන්දර්ය අංශය,
කොළඹ අධ්‍යාපන කලාපය.

## වර්ණය (colour)

### විසංගත වර්ණ
COMPLIMENTARY COLOUR

කිසියම් වර්ණ දෙකක් අතර අසමාන ලක්ෂණ පෙන්නුම් කරන්නේ නම් එම වර්ණ විසංගත වර්ණ වේ.
මෙම වර්ණ වර්ණ චක්‍රය ප්‍රති විරුද්ධව පිහිටයි.






නිල් ≠ තැඹිලි

කහ ≠ දම්

රතු ≠ කොළ

විසංගත වර්ණ භාවිත නිර්මාණ
COMPLIMENTARY HARMONY





සෞන්දර්ය අංශය,
කොළඹ අධ්‍යාපන කලාපය.

# ''අපේ පාසල් වත්ත''



(ප්‍රකාශන චිත්‍ර - පැස්ටල් මාධ්‍ය)



**1 වන පියවර**
චිත්‍රය ඇඳීමට සුදුසු කඩදාසියක උචිත ලෙස මානව රූප සම්පිණ්ඩනය කරන්න. පසුව ඊට උචිත ලෙස පරිසරය ගොඩනගන්න.



**2 වන පියවර**
ඇඳගත් මානව රූප ක්‍රමිකව වර්ණ කරන්න.





**3 වන පියවර / 4 වන පියවර**
ළඟ ඇති මානව රූප තද වර්ණ වලින් ද දුර ඇති මානව රූප ළා වර්ණ වලින් ද වර්ණ කරන්න.



**5 වන පියවර**
ඇඳගත් මානව රූප හා පරිසරය, ක්‍රමිකව වර්ණ කරන්න.



**6 වන පියවර**
මෙහිදී සැලකිලිමත්වන්න, පාසල්වත්ත, සිටින්නන්ගේ ඇඳුම් පැලඳුම් වර්යා රටාවන් පිළිබඳව.



**7 වන පියවර**
අවසානයේ අවශ්‍ය පරිදි අවශ්‍ය ස්ථාන වර්ණ මගින් මතු කිරීම සිදු කරන්න.
ලා පැහැති වර්ණ භාවිතා කරන්න.




**8 වන පියවර**
ඊට උචිත ලෙස පරිසරය ද මානව රූපද වර්ණ කර නිමකරන්න.


නිර්මාණය : කේ.ඒ.යොහාන් පෙරේරා - චිත්‍ර කලා ආචාර්ය,
සාන්ත ඇන්ඩෲ විද්‍යාලය, කොළඹ 15.

# ''සුවඳ මලයි - සමනලයි ''

(ප්‍රකාශන චිත්‍ර - කොලාජ් මාධ්‍ය)



**පියවර 1**
ඔබගේ කොළයේ තිරස් අතට මල සහ සමනලයා සටහන් කරගන්න.



**2 වන පියවර**
ඉවත ලන කොළ කැබලි ඉරා සමනලයාමත අලවමු.
(මෙහිදී ඔබ කැමති පරිදි කොළ වෙනස්කළ හැකිය)



**3 වන පියවර**
ඉවත ලන පත්තරකොළ කැබලිඉරාමල මත අලවමු.



**4 වන පියවර**
කොළ කැබලිඉරාකොළමත අලවමු.

සෞන්දර්ය අංශය, කොළඹ අධ්‍යාපන කලාපය.



**5 වන පියවර**
කොළ කැබලි ඉරා පසුබිමෙහි අලවමු.



**6 වන පියවර**
පසුබිම පුරාම කොළ අලවාගමු.



**7 වන පියවර**
පසුබිම පුරාම කොළ අලවා සම්පූර්ණ කරගමු. අවශ්‍ය නම් රේඛාමය වශයෙන් මඳක් මතු කරගත හැකිය.

නිර්මාණය : අනෝමජී රාජපක්ෂ - චිත්‍ර කලා ආචාරිනි,
තර්ස්ටන් විද්‍යාලය, කොළඹ 07.



සෞන්දර්ය අංශය, කොළඹ අධ්‍යාපන කලාපය.

කොවිඩ් 19 ව්‍යසනය හේතුවෙන්
දීර්ඝ කාලීනව දුරස්ථ අධ්‍යාපනය
සඳහා යොමු වීමට සිදු වූ සිසු
දරු දැරියන් උදෙසා මෙන්ම,
විශේෂයෙන් ම විවිධ ගැටලු
හේතුවෙන් මාර්ගගත අධ්‍යාපනය
සඳහා යොමු විය නොහැකි වූ
දරු දැරියන් උදෙසා කෙරෙන
සත්කාරයකි.

මෙහෙයවීම:

**සෞන්දර්ය අංශය,**
**කොළඹ අධ්‍යාපන කලාපය.**

පරිගණක නිර්මාණය : රුවන් උපසේන - චිත්‍ර කලා ආචාර්ය,
සාන්ත ජෝසප් විදුහල, කොළඹ 14.